# බුත්තල ප්‍රාදේශීය සභාව

# මොණරාගල දිස්ත්‍රික්කය

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 16 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බුත්තල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ප්‍රතිපූර්ණය විය යුතු වැටුප් හා මන්ත්‍රී දීමනා රු. 2,045,908 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3..2 <u>ලැබිය යුතු ගිණුම්</u>

(අ) සමාලෝචිත වර්ෂයේ මෝටර් ග්‍රේඩරය, මාර්ග තලනය, බැකෝ ලෝඩරය හා ටිපර් රථය කුලියට දීමෙන් සභාවට අයවිය යුතුව තිබූ රු. 6,900,173 ක මුදල අයකර ගැනිමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) 1989 හා 2012 වර්ෂය දක්වා ඉදිරියට එමින් පවතින දේපල 07 කට අදාල හිඟ බදු කුලී රු. 1,830,391 ක් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) නව කඩ කාමර ඉදි කිරීමේදී ඉවත් කළ පැරණි කඩ කාමර හිමියන්ගෙන් අයකර ගත යුතු රු. 162,683 ක හිඟ කඩ කාමර කුලී සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

1.3.3. <u>ගෙවිය යුතු ගිණුම්</u>

වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.309,340 ක හිඟ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුලදී ද ක්‍රියාකර නොතිබුණි.

1.3.4 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 386,853,792 ක වත්කම් විෂයන් 03 ක්, රු. 9,264,772 ක වගකීම් විෂයයන් 02 ක්, රු.59,596 ක වියදම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

**02. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු. 1,094,873 ක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු. 10,363,126 ක් වුයෙන් මූල්‍ය ප්රතිඵලයේ ශුද්ධ අඩුවීම රු. 9,268,253 ක් විය.

**2.2 <u>ආදායම් පරිපාලනය</u>**

2.2.1 හිඟ ආදායම්

---------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158 හා 159 වගන්තියේ විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.36,896,584 ක් වු හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

**2.2.2 වරිපනම් බදු**

**---------------**

(අ) 2007 වර්ෂයෙන් පසු වරිපනම් බදු සඳහා දේපල තක්සේරු කිරිමක් සිදු කර නොතිබුණි.

(ආ) රු. 10,000 කට වැඩි හිඟ වරිපනම් බදු ශේෂ පවතින බදුකරුවන් 48 දෙනෙකුගෙන් රු. 568,475 ක් වු වරිපනම් අයකර ගැනීමට විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

**2.2.3 <u>බදු කුලී</u>**

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛ විධිවිධාන අනුව සභාව සතු කඩ කාමර කුලි තක්සේරු කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී කඩ කාමර බදු දීමෙන් කඩ කාමර 17 ක කඩ කුලි වශයෙන් රු. 677,700 ක් හා ප්‍රමාද ගාස්තු වශයෙන් එකතුව වූ රු. 855,502 ක් අය කර ගෙන නොතිබු අතර බදු ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කිරිමට හෝ කඩ වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

2.2.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ හිඟ මුදල රු. 1,936,946 කි.

## 2.3 <u>අධිභාර</u>

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.733,241 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) දේශිය ණය හා සංවර්ධන අරමුදලින් රු. 25,563,565 ක ලබාගෙන තිබු ණය මුදලට අදාළව 2013 සැප්තැම්බර් 30 සිට 2014 ඔක්තෝබර් 31 දක්වා ගෙවිය යුතු වාරික 13 ක් නියමිත පරිදි නොගෙවීම නිසා ගෙවිය යුතුව තිබු රු. 1,982,074 ක පොළියට අමතරව රු. 122,859 ක අධිභාර පොළියක් ගෙවීමට සිදුව තිබුණි.

(ආ) සභාවේ සේවය කරන සේවකයින් 52 කට අදාලව 2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව අයකරන ලද රු. 1,237,469 ක් රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල අදාළ අරමුදලට ගෙවීම් නොකර සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවීම් කර තිබුණි.

(ඇ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු. 271,318 ක් වියදම දරා තිබූ අතර වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය සවි කළ යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යනාදිය පිළිබඳව කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මුරකරු, රියදුරු ක්ෂේත්‍ර කම්කරු, පුස්තකාල කම්කරු ආදි තනතුරුවල අනියම් හෝ ආදේශක පදනම මත 1987 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුල සේවය කරන ලද සේවකයන් 26 දෙනෙකු ස්ථිර සේවයට පත්කර තිබුණද ඔවුන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව නොතිබුණි.

(ඉ) ස්ථිර හා අනියම් පදනම මත බඳවාගෙන තිබූ සෞඛ්‍ය, මාර්ග හා ක්ෂේත්‍ර කම්කරුවන් 05 දෙනෙකු අදාල කාර්ය සඳහා යොදා නොගෙන කාර්යාලීය කළමණාකරන සේවයේ පුරප්පාඩු නොතිබියදී විවිධ විෂයයන්ට අදාළව කළමණාකරන සහකාර තනතුරුවල රාජකාරි පවරා තිබුණි.

(ඊ) අනුමත කාර්ය මණ්ඩලයට අනුව කාර්යාල කාර්යය සහායකයින් දෙදෙනෙකු යොදවා ගැනීමට අනුමත වී තිබුණද, අනිමැතියකින් තොරව ස්ථිර හා අනියම්, සෞඛ්‍ය මාර්ග කම්කරුවන් 05 දෙනෙකු කාර්යාල සහායක රාජකාරි සඳහා යොදාගෙන තිබුණි.

(උ) සේවාවන් වලදී භාවිතා කිරීම සඳහා දිවි නැගුම දෙපාර්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 17 දින ලබා දී තිබූ රු. 1,178,000 ක් වටිනා Laksteel වර්ගයේ ගැල්වනයිස් බට 1064 න් අනුමැතියකින් තොරව රු. 859,143 ක් වටිනා ගැල්වනයිස් බට 776 ක් වැල්ලවාය,කතරගම හා තණමල්විල ප්‍රාදේශිය සභාවලට ලබාදී තිබූ අතර ඒ සඳහා ලැබීම් නියෝග විගණිත දිනය වූ 2015 ජුනි 05 දින වන විටත් සභාවට ලැබී නොතිබුණි. සභාව සතුව තිබූ රු.318,857 ක් වටිනා ගැල්වනයිස් බට 288 ක් ගිණුම්ගත කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

-----------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1)(i) වගන්තයේ විධිවිධාන වලට පටහැනිව පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ ආදේශක, සෞඛ්‍ය කම්කරුවකු බඳවාගෙන රු.100,052 ක් වැටුප්, දීමනා, සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් වශයෙන් ගෙවා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පාලනය**

**-------------------------**

**(අ) උඩඅරාව ජනාවාස 02 මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම**

**--------------------------------------------------------------------------**

2014 වර්ෂයේ දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩ සටහන යටතේ ඉහත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු. 929,870 ක මුදලකට සමිතියක් සමඟ 2014 ජුනි 14 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2014 දෙසැම්බර් 05 දින අත්තිකාරම් වශයෙන් රු. 185,997 ක් කොන්ත්‍රාත්කාර සමිතියට ගෙවා තිබුණි. 2015 ජුනි 04 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මාර්ගය දෙපස අද්දර අඟල් 9 ක් ගැඹුරට කොන්ක්‍රීට් කළ යුතු වුවත් පරීක්ෂා කරන ලද ස්ථාන දෙකක ගැඹුර අඟල් 9 ක් හා 6 ½ ක් බව නිරීක්ෂණය විය.

**(ආ) මනම්පිටිය ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම**

**-----------------------------------------------------**

2014 හුදකලා ගම්මාන වැඩ සටහන යටතේ ඉහත ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රු. 971,905 ක මුදලකට සමිතියක් සමඟ 2014 ජුනි 10 දින ගිවිසුමකට එළඹ කොන්ත්‍රාත්කාර සමිතිය වෙත රු. 836,738 ක් ගෙවා තිබුණි. 2015 ජුනි 04 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අදාල ඉදිකිරීම පෞද්ගලික ඉඩමක කර තිබූ අතර ඉඩම පවරා ගැනීමක් සිදුකර නොතිබුණි.

(ii) ඉදිකර තිබූ ළිඳට ළඟා වීමට නොහැකි වන පරිදි වල් බිහිවී තිබුණි.

(iii) ගෙවීම් බිල්පත මඟින් ගෙවීම් කර තිබූ පහත වැඩ කොටස් ඉටුකර නොතිබුණි.

- ❖ පොම්පාගාරයේ දොර සවි කිරීම
- ❖ ජනෙල් වල තීන්ත ආලේප කිරීම

(iv) ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අතරමඟ නතර කර තිබුණි.

**(ඇ) 143/2 උඩ අරාව තොටිල්ලකැටිය මාර්ගයේ කුට්ටිගල් ඇතිරීම**

2014 වර්ෂයේ මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන යටතේ ඉහත මාර්ගයේ කුට්ටිගල් ඇතිරීමට රු. 500,000 ක මුදලකට එක්තරා සමිතියක් සමඟ 2014 ජුනි 10 දින ගිවිසුමකට එළඹ තිබූ අතර ගිවිසුම්ගත මුදල වූ රු. 500,000 ක මුළු මුදලම කොන්ත්‍රාත්කාර සමිතිය වෙත ගෙවා තිබුණි. 2015 ජුනි 04 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගෙවීම් බිල්පත අනුව මීටර 96 ක් දිගට කුට්ටි ගල් ඇතිරීම සඳහා ගෙවීම් කර තිබුණද කුට්ටිගල් අතුරා තිබුණේ මීටර 86 ක් දිගට පමණි.

(ii) මාර්ගයේ දෙපස අඟල් 4 පළලට හා අඟල් 9 ක් ගැඹුරට කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ගෙවීම් කර තිබුණද, එසේ කරන ලද ස්ථාන 03 ක කොන්ක්‍රීට් තට්ටුවේ ගැඹුර 6" ,7" හා 8" වශයෙන් තිබුණි.

(iii) මාර්ගයේ සමහර ස්ථානවල කුට්ටිගල් ගිලා බැස ගොස් තිබුණි.

**3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

(අ) ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 2013 නොවැම්බර් 08 දින අංක 12/සං/05/කසල/බදුන් දරන ලිපිය මඟින් කසල කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා ලීටර් 20 කසල බදුන් 500 ක් ගෘහස්ථ මට්ටමින් බෙදීම සඳහා 2013 නොවැම්බර් 08 දින ලබාදී තිබුණි. එම බඳුන් බෙදා හැරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් මහගොඩයාය ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භූමියේ ගබඩා කර තිබුණි. එම බදුන් තොග ලේඛනවලට ඇතුලත් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිචක්‍රියකරණය කළ හැකි කසල රැස් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකර තිබූ අතර මේ සඳහා අතරුදවුම් මුදල්ද ඇතුළුව රු. 2,029,126 ක් කොන්ත්‍රාත්කාර සමිතිය වෙත ගෙවා තිබුණි. කර්මාන්තය 2014 පෙබරවාරි 05 දින වැඩ නිම කර තිබූ අතර ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම ලිපියෙහි සඳහන් පරිදි කර්මාන්තය කරනු ලබන ඉඩමෙහි අයිතිය සභාව සතු කර ගැනීමෙන් පසු අදාල ඉදිකිරීම් කළයුතු බව පළාත් පාලන කොමසාරිස් දන්වා තිබුණි. එසේ අයිතිය සතු කර ගැනීමකින් තොරව අදාල කර්මාන්තය සිදුකර තිබුණි.

(ඇ) ප්‍රතිචක්‍රියකරණය කළ හැකි කසල රැස් කිරීමේ මධ්‍යස්ථානය භෞතිකව පරීක්ෂාවේදී මෙම මධ්‍යස්ථානය මේ වන විටත් කසල කළමනාකරණය සඳහා පවත්වා නොමැති බවත්, මධ්‍යස්ථානයට විදුලිය හා ජල සැපයුම ලබා දී නොමැති බවත්, ඉදිකර ඇති වැසිකිලිය සඳහා අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැසිකිලි වලක් සකස් කර නොතිබූ බවත් ගොඩනැගිල්ලේ පිටුපස දොර පියන නියමිත පරිදි වැසීමට නොහැකි බවත් නිරීක්ෂණය විය.

## 04. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය